ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | HRC/SUO/MOTU/ 05/26 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 10. 07. 2026 |

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර මහතා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,
බන්ධනාගාර දෙපාර්තමේන්තුව,
කොළඹ 09.

<u>මීගමුව බන්ධනාගාරය වෙතින් මාරු කර යවනු ලැබූ රැඳවියන්ට වැලිකඩ බන්ධනාගාරයේදී සිදුකරනු ලබන වධහිංසාව සම්බන්ධයෙනි.</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් වධහිංසා කිරීමට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇති අතර, ඒ අනුව 2026.07.10 දින වැලිකඩ බන්ධනාගාරයේ ස්ථානීය පරික්ෂණයක් සිදුකරන ලදි.

එම විමර්ශනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වී ඇත.

1. Y වාට්ටුවේ රඳවා සිටින රැඳවියන්ට පහරදීම් සහ අඩම්තේට්ටම් වලට ලක්වන බවට කරුණු ඉදිරිපත් කර ඇත.

2. එම වාට්ටුවේ සිටින සමහර රැඳවියන්ට ප්‍රතිකාර නොලැබෙන බවට කරුණු ඉදිරිපත් වී ඇති අතර, හදිසි ප්‍රතිකාර අවශ්‍ය අය ද සිටින බවද එහිදී නිරීක්ෂණය විය.

3. රැඳවියන්ව බැලීම සඳහා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් පැමිණෙන අවස්ථා වලදී රැඳවියන්ට රැගෙන එන ඇඳුම්, ආහාර පාන සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබානොදීම.

4. සමහර රැඳවියන් මේවනවිට මහාධිකරණයෙන් ඇප ලබා ඇතත්, ඔවුන් සම්බන්ධව ඉදිරි නීතිමය කටයුතු සිදු නොවීම.

ඉහත කරුණු පිළිබඳව ඔබගේ අවධානයට යොමු කරවන අතර, ඒ පිළිබඳව පරීක්ෂා කොට ඒ සම්බන්ධව පියවර ගන්නා ලෙස මෙයින් දන්වා සිටිමු. ඔබ ගනු ලබන පියවර පිළිබඳව කොමිෂන් සභාව ද දැනුම්වත් කිරීමට කටයුතු කරන ලෙසට වැඩිදුරටත් දන්වා සිටිමු.

කොමිෂන් සභාවේ නියමයට පරිදි,

10/07/26

ඩී. පී. පී. ප්‍රනාන්දු
ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ඩී.පී.පී.ප්‍රනාන්දු,
ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ස/-

පිටපත : ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.<br>இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04.<br>No. 14, R. A. De Mel Mawatha, Colombo 04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011 - 250 5451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 - 250 5541/74 |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011 - 250 5521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |

ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk